# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022**

**2024 ඔක්තෝබර් / නොවැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

## සිංහල (නව නිර්දේශය)

**පුරාතන සිංහල සාහිත්‍යය හා භාෂා ප්‍රවේශය- SINH 18224**

පළමුවන කොටසත්, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. අ) පහත සඳහන් උද්ධෘතයේ අර්ථය ලිහිල් බසින් ලියා, එහි අවස්ථා සම්බන්ධය පැහැදිලි කරන්න.

ඉක්බිත්තෙන් ඒ මානවකයා ඒ සියලු කථා බෝධිසත්වයන්ට කීයේ ය. එබස් ඇසූ මහ බෝසතාණෝ ''මානවකය, ඒ සියලු ප්‍රවෘත්තිය මට කියන්නා වූ තා විසින් කළ දෑ ඉතා යහපත් වන්නේ ය''යි කියා මෑණියන්ගේ ආයුසංස්කාරය බලන තැනැත්තෝ ''අද ම මියෙති''යි දැන ''මානවකය, මෙසේ උන්වහන්සේගේ අභිප්‍රාය පරීක්ෂා කරම්හ''යි එක් දිඹුල් දණ්ඩක් ගෙන්වා ගෙන සැස මහ බෝසතාණෝ තමන්ගේ ප්‍රමාණයෙන් කාෂ්ටරූපයක් කොට ඉස හා සමග පොරව තමන් වැදහොත් තැන උත්තැති කොට හොවා රැනක් බැඳ අතවැස්සාට කියන්නාහු ''දරුව, පොරොවක් ගෙන ගොස් මාගේ මෑණියන් වහන්සේට මා මෙතන වැදහොත් නියාව හඟවාලව''යි කිවූ ය. එබස් ඇසූ මානවකයා ගොස් ''ආර්යයන් වහන්ස, ආචාරීන් වහන්සේ පන්සලැ තමන් වහන්සේ වැදහෝනා තැන වැදහොත් සේක. මා විසින් වැදහොත් තැන දැන ගන්නා සඳහා රැනක් බැඳ තබන ලද. මේ පොරොව ඇරගෙන රැන සනින් ගොස් ඉදින් පිළිවන් වී නම් පුතණුවන් වහන්සේ මරාපුව මැනව''යි කීය. එබස් ඇසූ බෝධිසත්ත්ව මාතාවෝ ''මා නොහරනවා දැ''යි කිවූ ය. ''කවර කාරණයකින් මා නුඹ වහන්සේ හැරපියම් දැ''යි කීය.

(ලකුණු 12 (8+4)

ආ) පහත දැක්වෙන පද්‍යයන්හි අර්ථය ලිහිල් බසින් ලියා, සිරි රහල් හිමියන්ගේ වර්ණනා චාතුර්යය කෙටියෙන් පැහැදිලි කරන්න.

උදුල සොම් කැලුම් නිසයුරු හිමි පුවළ
පහළ වන බැවින් තම වෙත නිසඹු දොළ
ලකළ ගුවත්තල සිරියහන නිකසළ
අතුළ කුසුම් විලසින් සැදෙත තුරු වැළ

වඩිමින් සවස තල හැසිරෙන දිගතු වල
සොබමින් සුනිල් මිණි නිල් නුබ තුර විපුල
පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

මහතුන් හසළ තමහට යස පිහිට ලෙස
නියතින් නොහළ යුතු බව පැමිණෙත වෙහෙස
සුදනන් පැවති සිරිතැයි දන්වත් විලස
නුබමින් සමග ගෙවනුය දහවල් දවස

සැදෑ ළෙන් වරුණ දෙව්රද මුහුද විසූ
සදෑ සහසකර එන මහවත සැලසූ
විදෑ උපුල් පිළ මෙන් රත් පටින් වැසූ
සැදෑ වලා පෙළ පැළඳිග පෙනුණු පසූ

(ලකුණු 12 (8+4)

## II කොටස

02. ජාතක සාහිත්‍යය පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් කොට, සිංහල ජාතක පොතේ සාහිත්‍යමය අගය විමර්ශනය කරන්න.

නැතහොත්

'මානව සමාජය හා සම්බන්ධ විවිධ චරිත ජාතකකථා මඟින් පිළිබිඹු වෙයි' නිදසුන් දෙමින් පරීක්ෂා කරන්න.

03. ශබ්දාර්ථ සුසංයෝගයෙන් යුතු මනහර පද්‍ය කාව්‍යයක් නිර්මාණය කිරීමෙහි ලා සිරි රහල් හිමියන් පළ කළ කුසලතාව සැළලිහිණි සන්දේශය ඇසුරින් විමසන්න.

04. කුරුණෑගල යුගයේ සාහිත්‍ය කෘතිවලින් පිළිබිඹු වන විශේෂ ලක්ෂණ කෙරෙහි සාවධාන වෙමින්, තත් යුගයේ බිහි වූ සාහිත්‍ය නිර්මාණ පිළිබඳ සමාලෝචනයක් කරන්න.

05. සිංහල පද්‍ය සාහිත්‍යය, ස්වාධීන මාර්ගයකට ප්‍රවිෂ්ට කරවීමෙහි ලා ගම්පොළ යුගයේ කවීන්ගෙන් සැපයුණු දායකත්වය කෙබඳුදැ යි නිදර්ශනාශ්‍රයෙන් පැහැදිලි කරන්න.

නැතහොත්

සිව්පද කාව්‍යාකෘතිය ප්‍රචලිතවීමෙහි ලා කෝට්ටේ යුගයේ කවීන්ගේ නිර්මාණ බලපෑ ආකාරය නිදසුන් දෙමින් විග්‍රහ කරන්න.

## III කොටස

06. 'භාෂාව වූකලී පෞද්ගලික මෙන්ම සමාජමය සංසිද්ධියකි'' වාග්විද්‍යාත්මකව විග්‍රහ කරන්න.

07. ෆර්ගියුසන්ගේ භාෂාද්විරූපතා විග්‍රහයට වඩා සිංහල භාෂා ද්විරූපතාව වඩාත් සංකීර්ණ ස්වරූපයක් දරන්නේ කවර හේතු නිසාදැ යි සාකච්ඡා කරන්න.

08. උපභාෂා යන්න හඳුන්වා, එවැනි භාෂාස්වරූප නිර්මාණයවීමට තුඩු දෙන ප්‍රධාන සාධක මොනවාදැ යි පරීක්ෂා කරන්න.

09. 'කිසියම් සංස්කෘතියක් අධ්‍යයනය කිරීමේදී ප්‍රශස්ත මූලාශ්‍රය වන්නේ තදනුබද්ධ භාෂාවයි' විමර්ශනය කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ප්‍රමාණවත් සටහන් ලියන්න.

අ) භාෂණ සිංහලයේ ස්පර්ශ හා අස්පර්ශ ශබ්ද
ආ) සිංහල භාෂාවේ ප්‍රාස්තාවික භාෂා ස්වරූප
ඇ) සිංහලයේ පරිමිත භාෂා
ඈ) සිංහල භාෂාවේ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය ප්‍රභේද

(2 - 10 පිළිතුරුවලට ලකුණු 19 බැගිනි)

************************************